(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 1(9).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2009 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා**

## 2009 ඔක්තෝබර් මස 08 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0125/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජයේ සේවකයින්ට ඉඩම් මිලදී ගැනීම හා නිවාස ඉදිකර ගැනීම සඳහා සහනදායී පොලී මත ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේනම්, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ කොපමණ ණය මුදලක් ලබා දී තිබේද;

(iii) මේ යටතේ 2008 සහ 2009 වර්ෂවල ලංකා බැංකුව මගින් කොපමණ ණය මුදලක් ලබාදීමට සැලසුම්කර තිබේද;

(iv) ඉහත එක් එක් වර්ෂයේ වෙන වෙනම කොපමණ ණය මුදලක් ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ණය පොරොත්තු ලේඛනයේ සිටින රජයේ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 වර්ෂය තුළ කොපමණ සංඛ්‍යාවකට, කොපමණ ණය මුදලක් ලබාදී අවසන් කර තිබේද;

(iii) මෙම වර්ෂය තුළ කොපමණ සංඛ්‍යාවකට ණය ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) රජයේ සේවකයින්ගේ විශාල සංඛ්‍යාවකට මෙම ණය ලබා ගැනීමට නොහැකිවීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0128/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුහුණු ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා යොමු කරවීමට රජයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ ක්‍රියාත්මක වන්නේ නම්, 2007, 2008 සහ 2009 වර්ෂයන්හි දී කොපමණ පුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාවක් රැකියා සඳහා විදේශගත වී තිබේද;

(iii) එය විදේශ රැකියා සඳහා පිටව යන අයගෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) හෙදියන් පුහුණු කර විදේශ රැකියා සඳහා යොමු කිරීමට 2007 වර්ෂයේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන ලද බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ පුහුණු වැඩ පිළිවෙළක් ආරම්භ කළේ නම්, ඒ සඳහා කොපමණ මුදලක් වැය කර තිබේද;

(ii) 2007, 2008 සහ 2009 වර්ෂවලදී වෙන වෙනම පුහුණු හෙදියන් කොපමණ සංඛ්‍යාවක් විදේශ රැකියා සඳහා පිටව ගොස් තිබේද;

(iii) එම රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

275/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වාර්තාවලට අනුව රාජකාරී හා පුද්ගලික කටයුතු සඳහා වාහන පාවිච්චි කළ දුම්රිය දෙපාර්තමේන්තුවේ 4 දෙනෙකු 2006 ජුලි 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2006 ට පටහැනිව තමන්ට හිමි ඉන්ධන සීමාව ඉක්මවා පාවිච්චි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉන්ධන ලීටර් 6402 ක් වැඩිපුර පාවිච්චිකර ඇති එකී නිලධාරීන් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ රාජකාරී කවරේද;

(iii) සීමාව ඉක්මවා පාවිච්චි කළ ඉන්ධනවල මූල්‍ය වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0288/'09

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1996 වසරේ පළමු පන්තියට උසස්වීම් ලැබූ, දුම්රිය ස්ථානාධිපති කේ. සී. ඩබ්ලිව්. ආර්. ප්‍රනාන්දු මහතා ඇතුළු පිරිසකට වැටුප් වර්ධක 7ක විෂමතාවයක් ඇති බවත්;

(ii) මෙතෙක් එය නිවැරදි කිරීමට කටයුතුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 1994.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/94 හි 5. 3. 1. වගන්තිය හා 2/97 (111) වැටුප් පරිවර්තනය නිවැරදිව ක්‍රියාත්මක නොකිරීමෙන් වැටුප් වර්ධක 2ක් අහිමිව සහ 1994.08.01 දින සිට 1999.11.11 දක්වා එකම වැටුපෙහි රැඳීසිටි මෙම පිරිසට රා. ප. ච. 7/2003 අනුව 1997, 1998 සහ 1999 වසර තුනට හිමි වැටුප් වර්ධක 3 ද අහිමිකර ඇත්තේ කෙසේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අයට වඩා වසර තුනකට පසු උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨත්වයෙන් වසර 3ක් අඩු නිලධාරීන්ගේ වැටුප අදාළ නිලධාරීන්ගේ වැටුපට වඩා වැටුප් වර්ධක 3ක් ඉහළට තබා ඇත්තේ කවර පදනමක් යටතේද;

(ii) මෙය රා. ප. ච. 11/94 උල්ලංඝණය කරමින් ජ්‍යෙෂ්ඨත්වය නොසලකා හැරීමක් නොවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0358/'09

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි පිහිටුවා ඇති "රැකියා පියස" ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එමඟින් විදේශ රැකියා සඳහා යොමු කිරීමට සම්මුඛ පරීක්ෂණ පැවති සංඛ්‍යාව කොපමණද;

(iii) එකී සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගිවූ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ අතුරින් මේවනවිට විදේශ රැකියා සඳහා විදේශගතවූ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විදේශ රැකියා සඳහා එක් අයෙකුගෙන් අය කළ මුදල කොපමණද;

(ii) මේ වනවිට මුදල් ගෙවා ඇති සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා "ජොබ්ස් නෙට්" ආයතනය කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී තිබේද;

(ii) එහි කළමනාකාරවරු, අධ්‍යක්ෂ මණ්ඩලය සහ ලියාපදිංචි අංක කවරේද;

(iii) එය විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි වී තිබේනම් ලියාපදිංචි අංකය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0362/'09

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයට මෙවර යල් කන්නය වෙනුවෙන් දෙනු ලබන පොහොර සහනාධාරය සඳහා ඇණවුම් කරන ලද පොහොර වර්ග ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වගාකර මාසයකට ආසන්න කාලයක් ගතවී ඇතත් තවමත් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත එම සහනාධාර පොහොර නිකුත් කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එලෙස ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත පොහොර ලැබීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත පොහොර ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් කැඳවීමක් කළේනම් ඒ කවදා ද;

(iii) පොහොර ප්‍රවාහනය බාර දෙනු ලැබුවේ කවුරුන් වෙතද;

(iv) එම ආයතනයේ නම හා ලිපිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නියමිත කාලයට ගොවීන් වෙත සහනාධාර පොහොර නොලැබීමෙන් සිදුවන අපහසුතාව වළක්වා ගැනීම සඳහාත්, වෙන් කරනු ලබන ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහාත් ගනුලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0464/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොපමණ නගර සභා, ප්‍රාදේශීය සභා සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එම එක් එක් පළාත් පාලන ආයතනයේ 2006, 2007, 2008, 2009 වර්ෂයන්හි ආරක්ෂණ ආදායම හා සාමාන්‍ය ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත පළාත් පාලන ආයතන ඉහත වර්ෂයන් තුළ රාජ්‍ය හෝ වෙනත් ආයතන වලින් ණය ලබාගෙන තිබේද;

(ii) එසේනම්, ණය ලබාගත් ආයතනය, ණය කොන්දේසි, ලබාගත් ණය මුදල හා එය යෙදවූ ව්‍යාපෘතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් පළාත් පාලන ආයතනය විසින් වාර්ෂිකව ගෙවීමට ඇති ණය මුදල් ප්‍රමාණය, ණය වාරිකය සහ පොළිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0488/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ඇති ලියාපදිංචි වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෙළෙඳසැල් අයිතිකරුවන් කවුරුන්ද;

(iii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) මෙම වෙළෙඳසැල් හිමියන් තෝරාගෙන ඇත්තේ කවර පදනමක් යටතේද;

(v) වෙළෙඳසැල් ලාභියෙකු වීමට ඔවුන්ට තිබූ මූලික සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට මෙම වෙළෙඳසැල් පවත්වාගෙන යන්නේ එහි මුල් අයිතිකරුවන් විසින්ද;

(ii) කිසියම් අයෙකුට පවරා තිබේනම්, ඒ කවුරුන්ගෙන් කවුරුන් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම වෙළෙඳසැල් අයිතිකරුවන් විසින් ගෙවිය යුතු මාසික බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) බදු මුදල් අයකර ගන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0500/'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 48 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) යෝජනාකර ඇති පරිදි, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම මහා පරිමාණ කර්මාන්තයක් ඇතිවන ලෙස නව කර්මාන්තශාලා 300ක් පිහිටුවීම යටතේ මේවන විට ආරම්භකර ඇති මහා පරිමාණ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කර්මාන්තශාලා සහ ඒවා ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0511/'09

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගා/ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පනංගල ගංගාරාම විහාරස්ථානය අසල ගිංගඟෙන් එතෙරවීම සඳහා පාලමකට මුල්ගල් තැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එවකට අග්‍රාමාත්‍යවරයා සහ මහාමාර්ග අමාත්‍යවරයා ලෙස සිටි වර්තමාන අතිගරු ජනාධිපතිතුමා එම මුල්ගල තැබූ බවත්;

(ii) එම මුල්ගල තබා මේ වනවිට අවුරුදු 05 ක් ගත වී තිබෙන බවත්;

(iii) ගංගාරාම විහාරස්ථානයේ ආගමික කටයුතු සිදුවන අවස්ථාවන්හිදී ගම්වාසීන්ට ගඟෙන් එතෙරවීම සඳහාත්, පනංගල මහාබෝධි විදුහලට පැමිණෙන පාසල් දරුවන්ට ගඟෙන් එතෙරවීම සඳහාත්, මෙම පාලම අවශ්‍ය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) කොපමණ කාලසීමාවක් තුළ මෙම පාලම සෑදීම ආරම්භ කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0533/'09

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 ජූලි 01 වැනි දින වන විට,

2002 ජූලි 01 වැනි දින වන විට,

1995 ජූලි 01 වැනි දින වන විට,

පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් ක්‍රියාත්මකව පැවති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) අද වන විට සිටින වෛද්‍යවරු සංඛ්‍යාව වැටුප් ප්‍රමාණයන් සමග පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රෝගීන් හා වෛද්‍යවරුන් අතර අනුපාතය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉකුත් වසර පහ තුළ වාර්ෂිකව රෝහල්වලට ඇතුළත් කළ රෝගීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0534/'09

ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 ජූලි 01

2002 ජූලි 01

1995 ජූලි 01,

යන දිනයන්හි දී ක්‍රියාත්මකව පැවති පළාත් මට්ටමේ සහ ජාතික මට්ටමේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) අද වන විට සිටින ගුරුවරුන් සංඛ්‍යාව වැටුප් ප්‍රමාණයන් සමග පළාත් මට්ටමින් සහ ජාතික මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ගුරු සිසු අනුපාතය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පසුගිය වසර පහ තුළ වාර්ෂිකව පළමු ශ්‍රේණියට ඇතුළත් කළ ළමුන් සංඛ්‍යාව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2009 ඔක්තෝබර් මස 08 වැනි බ්‍රහස්පතින්දා)

0116/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ කලාප අංක 05 යටතට ගැනෙන අනුරාධපුර, පොළොන්නරුව, වව්නියාව, මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල සමාජ සුභසාධන ව්‍යාපෘති සඳහා 2006, 2007, 2008, 2009 යන වර්ෂයන්හිදී වෙන වෙනම කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතීන්හි වැඩ අවසන්කර තිබේනම්, වැඩ ආරම්භ කළ දිනය, වැඩ අවසන් කළ දිනය, ඇස්තමේන්තුගත මුදල හා ගෙවා ඇති මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009 වර්ෂය සඳහා තෝරාගෙන ඇති ව්‍යාපෘති හා ඇස්තමේන්තු කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0117/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ කලාප අංක 03 යටතට ගැනෙන කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්කවල සමාජ සුබසාධන ව්‍යාපෘති සඳහා 2006, 2007, 2008, 2009 යන වර්ෂයන්හිදී වෙන වෙනම කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතීන්හි වැඩ අවසන්කර තිබේනම්, වැඩ ආරම්භ කළ දිනය, වැඩ අවසන් කළ දිනය, ඇස්තමේන්තුගත මුදල හා ගෙවා ඇති මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009 වර්ෂය සඳහා තෝරාගෙන ඇති ව්‍යාපෘති හා ඇස්තමේන්තු කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0462/'09

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා ඒ ඒ වර්ෂයේදී ආනයන අපනයන පාලකවරයා විසින් බදු සහන යටතේ ලබාදුන් වාහන ආනයන බලපත්‍ර සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) බලපත්‍රලාභීන්ගේ නම්, වාහනයේ වර්ගය හා වැසි අංක කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම වාහන වල නිෂ්පාදිත වටිනාකම සහ වර්තමාන වෙළෙඳපොළ වටිනාකම කොපමණද;

(ii) මෙමඟින් අප රටට ලැබුණු බදු ආදායම කොපමණද;

(iii) අහිමි වූ බදු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0501/'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 43 පිටුවේ (සිංහල මාධ්‍ය) "වැවිල්ලට නවෝදයක්" වැඩසටහන යටතේ යෝජනා කර ඇති පරිදි, වැසී යාමේ තර්ජනයට මුහුණ දී ඇති තේ කර්මාන්තශාලාවලට මූල්‍ය පහසුකම් ලබා දී නවීකරණය කිරීමට පියවර ගන්නා බවත්;

(ii) එම කර්මාන්තශාලාවලට බදු පහසුකම් ලබාදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වැසී යාමේ තර්ජනයට මුහුණ දී ඇති බවට 2005 ජනාධිපතිවරණයෙන් පසුව හඳුනාගෙන ඇති කර්මාන්තශාලා කවරේද;

(ii) එම කර්මාන්තශාලාවලට ලබාදී ඇති මූල්‍ය පහසුකම් හා ඒවායේ වටිනාකම කොපමණද;

(iii) ලබාදී ඇති බදු සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0536/'09

ගරු රවි කරුණානායක මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වානේ සංස්ථාව පෞද්ගලීකරණය කරන ලද දිනය කවරේද;

(ii) පෞද්ගලීකරණය කරන ලද අවස්ථාවේදී සිටි සේවකයින් ගණන කොපමණද;

(iii) ඒ අවස්ථාවේදී එම රාජ්‍ය ආයතනය මිළදී ගත් තැනැත්තා කවරෙක්ද;

(iv) රජයට ගෙවන ලද මුදල කොපමණද;

(v) ශ්‍රී ලංකා රජයට ගෙවන ලද බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) දැන් එහි හිමිකරු කවරෙක්ද;

(vii) මේ වන විට එහි සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වසර දහයක කාලය සඳහා,

(i) රටේ සමස්ත වානේ අවශ්‍යතාව කොපමණද;

(ii) රටේ වෙළෙඳපොළ පංගුවට සාපේක්ෂව දේශීය නිෂ්පාදනය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0537/'09

ගරු රවි කරුණානායක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජයට අයත් ව්‍යාපාරයක් වශයෙන් බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් (බී. සී. සී.) පවරාගත් දිනය කවරේද;

(ii) ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමේ යෝජනා ක්‍රමයක් මගින් 2005 හෝ 2006 දී මුදල් ගෙවා එහි සේවක මණ්ඩලය ඉවත් කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එලෙස ගෙවන ලද මුදල කොපමණද;

(iv) ඒ වන විට සිටි සේවක මණ්ඩල සාමාජිකයින් ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එලෙස, ස්වේච්ඡාවෙන් විශ්‍රාම යැවීම යටතේ මුදල් ගෙවීමෙන් පසුව, බී. සී. සී. හි සේවකයින් ලෙස ඇතැම් පුද්ගලයන් නැවත සේවයට බඳවා ගැනීමට හේතුව කවරේද;

(ii) 2006 සිට 2009 අගෝස්තු 01 දින දක්වා මාසිකව ලැබූ ලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0544/'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 19 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) සඳහන්, "සමෘද්ධි සහන" වැඩ සටහන් මගින් යෝජනා කර ඇති පරිදි, සමෘද්ධි සහනාධාර ලැබීමට සුදුසුකම් තිබුණ ද විවිධ හේතු නිසා එම හිමිකම අහිමි වී ඇති අය අලුතින් සමෘද්ධි වැඩ සටහනට ඇතුළත් කර ගැනීම යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ 2006, 2007 සහ 2008 වර්ෂවලදී එලෙස ඇතුළත් කර ගෙන ඇති පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0596/'09

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දුම්රිය සාමාන්‍යාධිකාරී (පාලන) ගේ 2004. 10 .29 දිනැති ලිපියෙන්, දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ වැටුප් සැකසීමේදී 1996 වසරේ පළමු පන්තියට උසස්වීම් ලැබූ දුම්රිය ස්ථානාධිපති කේ. සී. ඩබ්ලිව්. ආර්. ප්‍රනාන්දු මහතා ඇතුළු පිරිසකට වැටුප් වර්ධක 7 ක විෂමතාවයක් සිදුවී ඇති බව පිළිගත්තද එය නිවැරදි නොකිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ගරු ප්‍රවාහන අමාත්‍යතුමා සමග පැවති සාකච්ඡාව අනුව, දුම්රිය සාමාන්‍යාධිකාරී (පාලන) වෙත මෙම විෂමතාවය ඉවත්කරන ලෙස 2008. 10. 07 හා 2008. 11. 09 දිනැති ලිපි මගින් උපදෙස් හා නියෝග ලබාදී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත අයගේ වැටුප් විෂමතාවය ඉවත් කිරීමට කඩිනම් පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0441/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මාතලේ දිස්ත්‍රික්කය තුළ 2008 සහ 2009 වර්ෂවල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ විශේෂ විදුලි ව්‍යාපෘති කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ව්‍යාපෘති සඳහා වෙන් වූ මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතීන් හි වැඩ අවසන් කිරීමට නියමිත දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0400/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බදු ගිවිසුම් යටතේ තෙල් පිරවුම්හල් සඳහා බදු දී තිබේ ද;

(ii) එවැනි ඉඩම් තුළ පිරවුම්හල් කොපමණ සංඛ්‍යාවක් තිබේ ද;

(iii) ඒවා අතර අයි. ඕ. සී. සමාගම යටතේ ඇති පිරවුම්හල් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත බදු ගිවිසුම් යටතේ බදු දීමෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට අයවිය යුතු හිඟ බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) යාවත්කාලීන නොකරන ලද බදු ගිවිසුම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0571/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජයේ සේවකයින්ට දේපල ණය ලබා දීම සඳහා ක්‍රියාත්මක කළ විශේෂ ණය ව්‍යාපෘතිය මගින් 2007 වර්ෂයේ දී ලංකා බැංකුව මගින් කොපමණ ණය මුදලක් ලබා දී තිබේද;

(ii) එක් එක් බැංකු ශාඛාව මගින් වාර්ෂිකව වෙන වෙන ම කොපමණ ණය මුදලක් ලබා දී තිබේද;

(iii) මෙම ණය සඳහා ආරම්භයේ දී ලබාදුන් උපරිම ණය මුදල සහ නියම කරන ලද පොලී ප්‍රමාණය කොපමණද;

(iv) දැනට එක් අයෙකුට ලබා දෙන ණය මුදල සහ අදාළ පොලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) උතුරු නැගෙනහිර පළාත්වල පදිංචි රජයේ සේවකයින්ට මෙම ණය මුදල ලබාදීම මන්දගාමීව සිදුවූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගැනීමට කොපමණ පිරිසක් පොරොත්තු ලේඛනයේ සිටින්නේද;

(ii) ඔවුනට කඩිනමින් ණය ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0572/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරුමැද පළාතේ කොපමණ පාසල් සංඛ්‍යාවක් අධ්‍යාපන කටයුතු සඳහා විවෘතව පවතින්නේද;

(ii) විවෘතව පවතින පාසල්වල කොපමණ සංඛ්‍යාවක ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සිටින්නේද;

(iii) කොපමණ පාසල් සංඛ්‍යාවක වැඩ බලන විදුහල්පතිවරුන් සේවය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම පළාතේ පාසල්වල විදුහල්පතිවරුන් ලෙස සේවය කිරීම සඳහා කොපමණ විදුහල්පති ශ්‍රේණිධාරීන් සංඛ්‍යාවක් අවශ්‍ය වන්නේද;

(ii) විදුහල්පති ශ්‍රේණියේ I, II සහ III යන පන්තිවලට අයත් විදුහල්පතිවරුන් වෙන වෙනම කොපමණ සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටින්නේද;

(iii) පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) විදුහල්පතිවරුන් ලෙස කටයුතු නොකරන ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) මෙම ශ්‍රේණිධාරීන් විදුහල්පතිවරුන් ලෙස පත් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0597/'09

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ, කොටුවේගෙදර ජාතික නිවාස යෝජනා ක්‍රමය ආරම්භ කළේ කවදාද;

(ii) එම අවස්ථාවේ සිටි නිවාසලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාසලාභීන්ට ලැබුණු ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් හිස් ඉඩම් කැබලි කොපමණ සංඛ්‍යාවක් කොටුවේගෙදර ජාතික නිවාස යෝජනා ක්‍රමය තුළ තව දුරටත් ඉතිරිව තිබේද;

(ii) එම හිස් ඉඩම් අතුරින් කැබලි කොපමණ සංඛ්‍යාවක් බැහැර කරනු සඳහා පුවත්පත් දැන්වීම් පළ කළේද;

(iii) එම හිස් ඉඩම් කැබලි ඉල්ලුම් කිරීම සඳහා සපුරාලිය යුතු වූ සුදුසුකම් කවරේද;

(iv) එම ඉඩම් කැබලිවල රජයේ තක්සේරු වටිනාකම කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගත් අයගේ නම්, ලිපිනයන් සහ ඔවුන් ගෙවීමට එකඟ වූ මිල ගණන් කවරේද යන්න එතුමිය සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0598/'09

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත්, යාය 15 පී 138 වාරි ඉඩම අ.ග.පි. 452/2 අංක 92, හෙක්ටයාර 1.022ක් විශාල ඉඩම මැනුම් කර මහවැලි සංවර්ධන අධිකාරිය විසින් වලිමුණිගේ හින්නියා මහතාට ප්‍රදාන පත්‍රයක් මඟින් ලබාදී තිබූ බවත්;

(ii) එම වාරි ඉඩම පසු පැවරීමකින් තොරව 2007.11.02 දින හින්නියා මහතා මියගිය බවත්;

(iii) හින්නියා මහතාගේ විවාහක බිරිඳ සුදුහකුරුගේ බේබිනා මහත්මිය ඔහුට පෙර මිය ගිය බවත්;

(iv) ඔවුන් දෙදෙනාගේ එකම දරුවා ඩබ්ලිව්. තේමාරිස් මහතා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) හින්නියා මහතාගේ මරණින් පසු ඔහුට අයත් ඉහත මහවැලි වාරි ඉඩම හිමිවිය යුත්තේ එකම දරුවා වූ තේමාරිස් මහතාට බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) අවස්ථා කිහිපයකදී ඉල්ලුම්කළද, තේමාරිස් මහතාට මේවන තෙක්, තම පියාගේ වාරි ඉඩම ලබා නොදීමට හේතු කවරේද;

(ii) කවර කාලසීමාවක් තුළ තේමාරිස් මහතාට අදාළ ඉඩම ලබා දෙන්නේද,

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0625/'09

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කර ඇත්තේ කවදා සිටද;

(ii) ඔහුගේ සුදුසුකම් කවරේද;

(iii) ඔහු විසින් මේ දක්වා සිදුකර ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ වෙනුවෙන් රජයෙන් වැය කළ මුදල කොපමණද;

(v) අදාළ සංචාරවල දී රටට ලබාදුන් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0245/'09

ගරු පේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2000 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ කාලය තුළ ඇමෙරිකා එක්සත් ජනපදයේ පුරවැසිභාවය හිමි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත මන්ත්‍රීවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එම මන්ත්‍රීවරුන්ට ඉහත එම රටේ පුරවැසිභාවය හිමිවූයේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0456/'09

ගරු පේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නව රියදුරු බලපත්‍රය නිෂ්පාදනය කිරීමේ ටෙන්ඩරය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ පාර්ශවයන්ගේ නම් හා ලිපිනයන් කවරේද,

(ii) එම ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළ මිල ගණන් කවරේද,

(iii) අදාළ ටෙන්ඩරය භාරදුන් සමාගමට ටෙන්ඩරය භාරදුන් දිනය කවරේද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සමාගම නව රියදුරු බලපත්‍ර නිෂ්පාදනය සඳහා යොදවන ලද ප්‍රාග්ධන ආයෝජන මුදල කොපමණද,

(ii) නිකුත් කිරීමට අපේක්ෂිත බලපත්‍ර සංඛ්‍යාව කොපමණද,

(iii) නව රියදුරු බලපත්‍රයට කලින් භාවිතා කළ රියදුරු බලපත්‍ර එකක් වෙනුවෙන් අදාළ සමාගමට මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලැබූ මුදල කොපමණද

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

0457/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (කාර්මික) තනතුරට බඳවා ගැනීමේදී තිබිය යුතු මූලික සුදුසුකම් කවරේද;

(ii) වර්තමානයේ පවතින සහකාර කොමසාරිස් (කාර්මික) තනතුර පුරප්පාඩුව පවතින අවස්ථාවේ ඒ සඳහා අයදුම්කළ මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත තනතුර සඳහා ඉහළ ම සුදුසුකම් තිබූ පුද්ගලයා බඳවා ගත යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) ඉහළ ම සුදුසුකම් සහිත පුද්ගලයින්ට එම තනතුර ලබා දීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේනම්, ඒ කවර කාලයක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ඔක්තෝබර් මස 20 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0459/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල වගකීමක් ඇති වෘත්තියක් වන රියදුරන් සඳහා වූ බලපත්‍රය නිකුත් කිරීමේදී එය සුපරීක්ෂාවෙන් සිදුකළ යුතු බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රියදුරු බලපත්‍රයක් නිෂ්පාදනය කිරීමේ ටෙන්ඩරය භාරදීමේදී අදාළ සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳව විමසිලිමත්විය යුතු බවත්;

(ii) නව රියදුරු බලපත්‍රය නිෂ්පාදනය කිරීමේ ටෙන්ඩරය භාර දී තිබෙන සමාගමේ ප්‍රධානියා, මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් දකුණු අප්‍රිකාවේ අධිකරණයකින් වසර 15ක සිරදඬුවමකට ලක් වූ පුද්ගලයෙක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0460/09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (කාර්මික) තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) එලෙස සංශෝධනය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සංශෝධනයට අනුව උක්ත තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය මෝටර් රථ පරීක්ෂකවරුන්ගේ උසස් කිරීමේ පරිපාටියක් බවත්;

(ii) උසස් කිරීමේ පරිපාටියක් නම් ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ, 2.4 සහ 2.5 වගන්තිවලට අනුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් අමාත්‍යාංශ ලේකම් හරහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගත යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, අදාළ අමාත්‍ය මණ්ඩල අනුමතිය ගත්තේද;

(ii) ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) අදාළ අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා නොගත්තේ නම් බඳවා ගැනීමේ පටිපාටිය නීති විරෝධී බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) (i) එසේ නම්, ඊට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) ඒ කවර කාලයක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0461/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වනවිට පුරප්පාඩුව පවතින ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුරු සඳහා බඳවා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාපරිපාටිය කවරේද;

(iii) එම බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලබන්නේද;

(iv) එසේනම්, ඒ කවර කාලයක් තුළද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ග්‍රාම නිලධාරි තනතුරු සඳහා පැවැති තරඟ විභාගයේදී ඉහළ ලකුණු ලබාගත් අය බඳවා ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0158/'09

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව මහවැලි නව සංවර්ධන කලාපය තුළ 2004 සිට 2009.03.31 දක්වා වාර්ෂිකව ලබාදුන් බිම් කට්ටි සංඛ්‍යාව;

(ii) ඉඩම්ලාභීන් තෝරාගත් නිර්ණායක හා ලබාදුන් සම්පූර්ණ බිම් ප්‍රමාණය ගොඩ/වාරි වශයෙන් වෙන් වෙන්ව;

(iii) සුදුසුකම් සපුරා තිබියදීත් ඉඩම් ලබාදීමට නොහැකිවූ සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික ව්‍යාපාර වෙනුවෙන් සමාගම් හෝ වෙනත් ආයතනවලට ඉඩම් ලබාදී තිබේද;

(ii) එසේනම්, අයදුම් කරන ලද සමාගමේ/ආයතනයේ ප්‍රධානියාගේ නම සහ ලිපිනය කවරේද;

(iii) එම ඉඩම් ලබාදීමට තිබිය යුතු සුදුසුකම් හා නිර්ණායක, ඉඩම් ලබාදුන් දිනය සහ ලබාදුන් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ලබාදුන් ඉඩම් යොදාගත් කාර්යය හා ඒ කවර කාලසීමාවක් සඳහාද;

(v) එම ඉඩම් නිශ්චිත කටයුතු සඳහා යොදවා තිබේද;

(vi) එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එක් එක් ඉඩමට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2009.03.31 දිනට බෙදාදීමට (ගොඩ/වාරි) ඉතිරිව ඇති බිම් ප්‍රමාණය කොපමණද;

(ii) අනිවාර්යයෙන්ම ඉඩම් ලබාදිය යුතු අය හඳුනාගෙන තිබේද;

(iii) එසේනම්, එම ප්‍රමාණය කොපමණද;

(iv) කවර කාලසීමාවක් තුළ ඔවුන්ට ඉඩම් ලබාදෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0172/'09

ගරු විජිත රණවීර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) එම්. එම්. සුමනාවතී මහත්මිය මාතර, දීයගහ බටහිර මහා විද්‍යාලයේ විදුහල්පතිනිය ලෙස සේවය කර 1991.01.01 දින සිට විශ්‍රාම ගොස් ඇති බවත්;

(ii) 1988.01.01 දින සිට කුසලතාවය හා ජ්‍යෙෂ්ඨතාවය මත ඇයට විදුහල්පති II ශ්‍රේණියට උසස්වීම් ලබාදිය යුතු බවත්;

(iii) එහෙත් ඇය විශ්‍රාම යන තෙක්ම අදාළ උසස්වීම ලබා නොදුන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විශ්‍රාම ගොස් ගතවූ වසර 18 තුළ සුමනාවතී මහත්මියගේ උසස්වීම සහ විශ්‍රාම වැටුප සකස්කර ගැනීමට ගනුලැබූ උත්සාහය සාර්ථක නොවූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත උසස්වීම සහ විශ්‍රාම වැටුප සකස්කර නොදෙන්නේ කවර හේතු නිසාද;

(ii) සියලු සුදුසුකම් සපුරා ඇති සුමනාවතී මහත්මියට අදාළ උසස්වීම ලබාදී, විශ්‍රාම වැටුප සකස්කර දෙනු ලබන්නේ කවදාද;

(iii) වයස අවුරුදු 78 ක් වන ඇයට අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා උසස්වීමත් ඊට නියමිත විශ්‍රාම වැටුපත් නොලැබුණු කාලයට වන්දි මුදලක් හෝ වෙනත් දීමනාවක් ලබාදෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 19 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) සඳහන්, "සමෘද්ධි සහන" වැඩ සටහන් යටතේ යෝජනා කර ඇති පරිදි, වයෝවෘද්ධ, ආබාධිත පවුල් සඳහා රුපියල් 3000 ක මාසික දීමනාවක් ලබාදීම යටතේ 2006, 2007, 2008 වර්ෂවලදී මහනුවර දිස්ත්‍රික්කයේ වයෝවෘද්ධ, ආබාධිත වූ අය කොපමණ සංඛ්‍යාවක් එම ව්‍යාපෘතියට ඇතුළත්කර ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2006, 2007, 2008 වර්ෂ වලදී එසේ හඳුනාගත් මහනුවර දිස්ත්‍රික්කයේ වයෝවෘද්ධ, ආබාධිත පවුල් සඳහා මාසිකව රුපියල් 3000 ක මුදල ලබා දීම ක්‍රියාත්මක පවුල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0177/09

ගරු විජිත රණවීර මහතා,—පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ අශ්වබල 03 ට අඩු බහුකාර්ය යන්ත්‍ර උපයෝගී කරගනිමින් පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි වඩුමඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයගේ නම, ලිපිනය, ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, අදාළ ප්‍රාදේශීය සභාව, ලියාපදිංචි අංකය, ව්‍යාපාරයේ ස්වභාවය, ආරම්භ කළ වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අශ්වබල 03ට අඩු බහුකාර්ය යන්ත්‍ර යොදා රැකියාවල නිරතවන වඩු කාර්මිකයන් සියලු දෙනා පරිසර බලපත්‍ර වාර්ෂිකව ලබාගත යුතුද;

(iv) පරිසර බලපත්‍රයක් ලබාගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙළ හා වැයකළ යුතු සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අශ්වබල 03 ට අඩු බහුකාර්ය යන්ත්‍ර සඳහා පාරිසරික බද්දක් අයකිරීම ආරම්භ කළේ කවදා සිටද;

(ii) 2008 සහ 2009 වර්ෂ සඳහා එම බදු මුදල ගෙවන ලද සංඛ්‍යාව කොපමණද;

(iii) වඩු කාර්මිකයින්ට විශාල වැයබරක් වන මෙම බදු මුදල අහෝසි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0627/'09

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1980 ජූලි වැඩ වර්ජනයට සම්බන්ධ වූ පේෂ කර්මාන්ත සේවකයන්ගේ හිඟ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එවකට සිටි කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති අමාත්‍යතුමා අංක 06/1540/230/039 හා 2006.08.18 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ නිරීක්ෂණය මත අමාත්‍ය මණ්ඩලය එම පත්‍රිකාව අනුමත කරමින් අදාළ ගෙවීම් කරන ලෙස කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශයට (පෙර, කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති) උපදෙස් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) ඒ අනුව, 2006 දෙසැම්බර් මස මුල් භාගයේදී ගෙවීම් කරන බවට කම්කරු කොමසාරිස් ජනරාල් විසින් නිවැරදි හිමිකරුවන් හඳුනාගෙන ගෙවීම් කිරීම පිණිස, හිඟ වැටුප සඳහන් විශේෂ දිවුරුම් ප්‍රකාශ නිකුත් කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ වැටුප් ගෙවීමට ඇති දිවුරුම් ප්‍රකාශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) (i) ඒ අනුව අදාළ පේෂකර්ම සේවකයන්ගේ හිඟ වැටුප් ගෙවීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0628/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාතලේ - මන්දණ්ඩාවෙල - පන්සල පාරේ අංක 20/10 දරන කම්කරු නිවාස වල වසර 50 කට ආසන්න කාලයක් පදිංචි පවුල් 03කට එම නිවාස වලින් ඉවත්වන ලෙසට නියෝග කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ කම්කරුවන් ලෙස සේවය කළ මොවුන් පසුගිය කාලය තුළ තම වියදමින් නිවාස අලුත්වැඩියා කර, ජලය හා විදුලියද ලබාගෙන ඇති අතර ඡන්ද නාම ලේඛන හා අනිකුත් බිල්පත්ද ගෙවා ඇති බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මෙම අයට සාධාරණය ඉටුකර තවදුරටත් මෙම නිවාසවල පදිංචියට ඉඩ ලබාදෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0704/'09

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂය සඳහා නැගෙනහිර පළාත් සභාව වෙනුවෙන් වෙන්කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම වෙන් කරන ලද මුදලින් අම්පාර දිස්ත්‍රික්කය වෙනුවෙන් කොපමණ මුදලක් වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත වෙන් කරන ලද මුදලින් අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0731/'09

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද බස්නාහිර පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

### (2009 ඔක්තෝබර් මස 20 වැනි අඟහරුවාදා)

0732/'09

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) බදුල්ල, මොනරාගල දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද ඌව පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0733/'09

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පොළොන්නරුව, අනුරාධපුර දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද උතුරු මැද පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0734/'09

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහනුවර, නුවරඑළිය දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද මධ්‍යම පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0735/'09

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කෑගල්ල, රත්නපුර දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද සබරගමුව පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0736/'09

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද වයඹ පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0737/'09

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිකුණාමලය, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලද නැගෙනහිර පළාත් සභා මැතිවරණයේදී තාවකාලික හැඳුනුම්පත් කොපමණ සංඛ්‍යාවක් නිකුත්කර තිබේද;

(ii) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(iii) මෙසේ තාවකාලික හැඳුනුම්පත් වෙනුවට ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට වැයවන මුදල කොපමණද;

(iv) ස්ථිර හැඳුනුම්පත් නිකුත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද;

(v) මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තු මැතිවරණයට හා ජනාධිපතිවරණයට පෙර අවසන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ඔක්තෝබර් මස 21 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0489/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2000 වර්ෂයේ සිට වන්දි හිමිකම් ලැබීමට නියමිත ආරක්ෂක හමුදාවේ පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වන්දි හිමිකම් ලෙස ලබාදෙන මුදල කොපමණද;

(iii) මේ වන විට කොපමණ සංඛ්‍යාවකට වන්දි හිමිකම් ලබා දී තිබේද;

(iv) අදාළ වන්දි හිමිකම් ලබාදීම කල් ගතවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0224/'09

ගරු පේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "පෙතඩීන්" එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) "පෙතඩීන්" එන්නත් රජයේ රෝහල්වලට ලබාදීම ආරම්භ කළේ කවදාද;

(iv) "පෙතඩීන්" එන්නත් භාවිත නොකර ඉතිරිව තිබෙන ප්‍රමාණය කොපමණද;

(v) "පෙතඩීන්" එන්නත් අපතේ යාමෙන් සිදුවූ මූල්‍යමය පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "මොපීන්" එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) "මොපීන්" එන්නත් රජයේ රෝහල්වලට බෙදාහැරීම ආරම්භ කළේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0205/'09

ගරු පේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) විදේශ ධීවර යාත්‍රා මගින් මාළු ගොඩබෑමේදී මාළු ශ්‍රේණිගත කිරීමක් සිදුකරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2005 සැප්තැම්බර් මාසයේදී, 2006 මැයි මාසයේදී සහ 2008 දෙසැම්බර් මාසයේදී විදේශ ධීවර යාත්‍රා මගින් මාළු ගොඩබෑමේදී, තුන්වැනි ශ්‍රේණියේ මාළු කිලෝග්‍රෑම් එකක් සඳහා ලංකා ධීවර සංස්ථාව අයකරනු ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0217/'09

ගරු පේමසිරි මානගේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2009 ජනවාරි මාසය තුළ දී ජපන් රජයේ විශේෂ නියෝජිත යෂූෂි අකාශි මහතා ශ්‍රී ලංකාවට පැමිණියේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යෂූෂි අකාශි මහතා ශ්‍රී ලංකාවට පැමිණියේ ශ්‍රී ලංකා රජයේ ආරාධනයක් මතද;

(ii) එසේ නම්, එලෙස ආරාධනා කළේ කවුරුන් විසින්ද;

(iii) ඒ මහතා ඉහත පාර්ශ්වයන් සමග සාකච්ඡා කළ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?